මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 මැයි මස 20 දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 04-2021 මැයි

# ආර්ථිකය තිරසාරව යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වීමට ශ්‍රී ලංකා මහ බැංකුව සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගනියි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2021 මැයි මස 19 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 ලෙස දැනට පවතින මට්ටමේ පවත්වාගෙන යෑමට තීරණය කළේය. දේශීය සහ ගෝලීය වශයෙන් වන සාර්ව ආර්ථික තත්ත්වයන්, සහ අපේක්ෂිත වර්ධනයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් මණ්ඩලය මෙම තීරණයට එළඹුණි. අඩු උද්ධමන වාතාවරණයක් තුළ හා මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සහ කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල මගින් ඇති කරන ලද නව අභියෝග මධ්‍යයේ ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වීමට දැනට පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යෑමට මුදල් මණ්ඩලය කැපවී සිටියි.

## කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල මගින් දැනට පවතින ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය සඳහා බාධා සිදු කර ඇත

පවතින දර්ශකවලට අනුව 2021 වසරේ මුල් කාලයේ දී මෙන්ම 2020 වසරේ දෙවන භාගයේ දී සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් වූ ශ්‍රී ලංකා ආර්ථිකය, කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල ඇති වීම සහ ප්‍රදේශ හුදකලා කිරීම ඇතුළු වසංගතය වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් නැවතත් බාධාකාරී තත්ත්වයන්ට මුහුණ දෙමින් සිටියි. සංචරණ සීමා තෝරාගත් ප්‍රදේශවලට පමණක් සීමා වීම සහ දැනට පවතින එන්නත්කරණ ක්‍රියාවලිය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වසංගතයෙන් වන අහිතකර බලපෑම කොවිඩ්-19 පළමු රැලි දෙකට සාපේක්ෂව අඩු වනු

ඇතැයි අපේක්ෂා කරන අතර, කොවිඩ්-19 තුන්වන රැල්ල මගින් නැවතත් වසංගතයේ බාධාකාරී ස්වභාවය සහ වසංගතය මධ්‍යයේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම පවත්වාගෙන යෑමේදී මුහුණ දී ඇති අභියෝග පෙන්නුම් කරයි. ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය සහාය අඛණ්ඩව අවශ්‍ය බව ද එමගින් අවධාරණය කරයි.

## විවිධ අභියෝග මධ්‍යයේ වුවද විදේශීය අංශය ස්ථාවරව පවතී

අපනයන අදායම ඉහළ යෑමට සාපේක්ෂව ආනයන වියදම වැඩි වශයෙන් ඉහළ යෑම හේතුවෙන් 2021 මාර්තු මාසයේදී වෙළඳ හිඟය පුළුල් විය. මේ අතර, පෙර වසරේ අනුරූපී කාලයට සාපේක්ෂව 2021 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව සැලකිය යුතු ඉහළ ගියේය. කෙසේ වෙතත්, මෑත කාලීනව සිදු වූ කොවිඩ්-19 ගෝලීය ව්‍යාප්තියේ ඉහළ යෑම සංචාරක අංශය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අතර ඒ හරහා විදේශීය අංශය කෙරෙහි නව අභියෝග ඇති කරයි. 2021 වසරේ මේ දක්වා කාලය තුළ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 6.6 කින් අවප්‍රමාණය වූ අතර අත්‍යවශ්‍ය නොවන ආනයන සහ ඇතැම් විදේශ විනිමය ගෙවීම් මත දැනට පවත්නා සීමා කිරීම් අඛණ්ඩව පවත්වා ගෙන යෑම දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ මත වන පීඩනය අවම කර ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග රට තුළට විදේශ විනිමය ගලා ඒම් සුරක්ෂිත කිරීමට ඉවහල් වූ අතර ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අතිරේක පූර්වාරක්ෂණ විධිවිධාන ද යොදා තිබේ. 2021 අප්‍රේල් මස අවසානය වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියන 4.5ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය මාස 3.2ක ආනයන සඳහා ප්‍රමාණවත් වේ. මෙයට, චීන මහජන බැංකුව සමඟ එළඹි ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුම ඇතුළත් නොවේ.

## ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ අවම මට්ටම්වල පොලී අනුපාතික පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය සඳහා ලබා දුන් ණය ඉහළ ගියේය

මහ බැංකුව විසින් මෙතෙක් අනුගමනය කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රමයෙන් සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ අවම මට්ටම් දක්වා සමස්තයක් ලෙස අඩු වීමක් පෙන්නුම් කෙරිණි. පවත්නා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ දේශීය වෙළඳපොළේ පවත්වා ගෙන යනු

ලබන ඉහළ රුපියල් ද්‍රවශීලතාව මගින් ආර්ථිකයේ ඵලදායී අංශවලට දැරිය හැකි පිරිවැයක් යටතේ ණය ලබා දීම හරහා ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්කිරීම සඳහා සහාය වීම අරමුණු කර ගෙන ඇත. ඒ අනුව, 2021 වසරේ පළමු කාර්තුවේ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ සඳහා ණය ලබා දීම් ද ඉහළ ගියේය. බැංකු සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දීම මගින් ආර්ථිකයේ අවශ්‍යතා ඇති අංශවලට ණය ලබා දීම ප්‍රවර්ධනය කිරීම සඳහා තවදුරටත් සහාය ලබා දෙනු ඇත. මේ අතර, 2021 වසරේ පළමු කාර්තුවේදී රාජ්‍ය අංශය බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය අඛණ්ඩව ඉහළ ගියේය. ආදායම් පහත වැටීම සහ වසංගතය ආශ්‍රිත වියදම් ඇතුළුව වියදම් ඉහල යෑම මධ්‍යයේ රජයේ මූල්‍ය අවශ්‍යතා ඉහල යෑමේ බලපෑම පිලිබිඹු කරමින්, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද යම් වැඩිවීමක් පෙන්නුම් කළේය. දේශීය ණය ඉහළ යෑම හේතුවෙන් පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය ඉහළ මට්ටමක පැවතුණි.

## උද්ධමනය කෙටි හා මැදි කාලීනව සියයට 4-6 පරාසය තුළ පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, මැදි කාලීනව ඇති විය හැකි පීඩනයන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත

මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සහ සමස්ත ඉල්ලුම් තත්ත්ව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් 2021 වසරේ මේ දක්වා කාලය තුළ දී උද්ධමනය අඛණ්ඩව අඩු මට්ටමක පැවතුණි. කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල මෙන්ම අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ඇති වන සැපයුම් අංශයේ බාධා මගින් කෙටි කාලීනව යම් උද්ධමන පීඩන ඇති විය හැකි වුවද, 2021 වසරේ ඉතිරි කාලය තුළදී උද්ධමනය අපේක්ෂිත ඉලක්කගත සියයට 4-6 පරාසයේ අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්ත ඉල්ලුම් තත්ත්වයේ අපේක්ෂිත වැඩි දියුණුවීම් සමග රාජ්‍ය මූල්‍ය සහ මුදල් උත්තේජක ක්‍රියාමාර්ගවල බලපෑම මැදි කාලීනව උද්ධමනය මත යම් පීඩනයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කළ ද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුදුසු අවස්ථාවන්හිදී ගනු ලබන ක්‍රියාමාර්ග මගින් එවැනි පීඩන අවම කර ගැනීමට හැකි වනු ඇති අතර, එමගින් මැදි කාලීනව උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ පවත්වා ගැනීමට කටයුතු කරනු ලබන අතරම, ඉදිරි කාලය තුළදී තිරසාර සහ ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා පහසුකම් සපයනු ලැබේ.

## ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනෙයි

ඉහත සඳහන් කළ පරිදි පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, දැනට පවත්නා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව මුදල් මණ්ඩලයේ අදහස විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 ලෙස දැනට පවතින මට්ටමේ පවත්වාගෙන යෑමට මුදල් මණ්ඩලය තීරණය කළේය. මහ බැංකුව විසින් දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ වර්ධනයන් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ඇති අතර නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ ඉලක්කගත සියයට 4-6 අතර පරාසයක උද්ධමනය පවත්වා ගනිමින් ආර්ථිකය තිරසාර වර්ධන මාවතකට ලඟා වීමට සහාය වීම පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සූදානමින් සිටියි.

**මුදල් ප්‍රතිපත්ති තීරණය : ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී**

| | |
|---|---|
| *නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)* | සියයට 4.50 |
| *නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)* | සියයට 5.50 |
| බැංකු අනුපාතිකය | සියයට 8.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 2.00 |

**තොරතුරු සටහන:**

මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය හමුව 2021 මැයි මස 20 වැනි දින පෙ.ව. 11.00 ට zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන අතර එය ෆේස්බුක් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2021 ජූලි මස 08 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | සැප් 20 | ඔක් 20 | නොවැ 20 | දෙසැ 20 | ජන 21 | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 |
|---|---|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 4.0 | 4.0 | 4.1 | 4.2 | 3.0 | 3.3 | 4.1 | 3.9 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.4 | 5.5 | 5.2 | 4.6 | 3.7 | 4.2 | 5.1 | - |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 2.9 | 3.0 | 3.0 | 3.5 | 2.7 | 2.6 | 3.1 | 3.0 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.8 | 4.5 | 4.5 | 4.7 | 4.2 | 4.1 | 4.3 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොවැ 20 | දෙසැ 20 | ජන 21 | පෙබ 21 | මාර් 21 | නොවැ 20 | දෙසැ 20 | ජන 21 | පෙබ 21 | මාර් 21 |
| සංචිත මුදල් | 936 | 964 | 976 | 978 | 1,029 | 1.9 | 3.4 | 4.3 | 1.5 | 1.5 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 9,136 | 9,406 | 9,533 | 9,651 | 9,839 | 22.3 | 23.4 | 23.7 | 23.8 | 21.5 |
| ශුද්ධ විදේශීය වත්කම් | (281) | (209) | (321) | (386) | (430) | -390.1 | -308.0 | -458.9 | -496.1 | -1,629.0 |
| ශුද්ධ දේශීය වත්කම් | 9,417 | 9,615 | 9,854 | 10,037 | 10,269 | 27.7 | 27.8 | 29.4 | 30.4 | 27.2 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 4,363 | 4,548 | 4,758 | 4,793 | 5,005 | 61.5 | 62.7 | 63.1 | 61.9 | 54.7 |
| රාජ්‍ය සංස්ථා සඳහා ලබා දුන් ණය | 1,011 | 1,002 | 1,058 | 1,080 | 1,098 | 25.9 | 22.5 | 29.0 | 29.7 | 26.5 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,094 | 6,171 | 6,197 | 6,276 | 6,388 | 6.2 | 6.5 | 6.9 | 7.8 | 7.5 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 11,194 | 11,462 | 11,643 | 11,790 (අ) | 12,010 | 20.8 | 21.4 | 21.6 | 21.9 | 20.4 |

(අ) සංශෝධිත

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2020 නොවැ අවසානයට | 2020 දෙසැ අවසානයට | 2021 ජන අවසානයට | 2021 පෙබ අවසානයට | 2021 මාර් අවසානයට | 2021 අප්‍රේ අවසානයට | 2021 මැයි 19 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 4.50 | 4.50 | 4.50 | 4.50 | 4.50 | 4.50 | 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 5.50 | 5.50 | 5.50 | 5.50 | 5.50 | 5.50 | 5.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 4.54 | 4.55 | 4.55 | 4.55 | 4.62 | 4.64 | 4.67 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 4.64 | 4.69 | 4.69 | 4.90 | 5.05 | 5.11 | 5.12 |
| දින 182 | 4.76 | 4.80 | 4.75 | 4.99 | 5.10 | 5.14 | 5.14 |
| දින 364 | 5.00 | 5.05 | 4.98 | 5.09 | 5.11 | 5.18 | 5.18 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 5.83 | 5.81 | 5.90 | 5.76 | 5.78 | 5.86 | 5.72 (අ) |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 10.55 | 10.29 | 10.17 | 10.08 | 9.91 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 8.71 | 8.38 | 8.37 | 8.26 | 8.28 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 6.01 | 5.80 | 5.58 | 5.36 | 5.20 | 5.07 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 7.37 | 7.14 | 6.88 | 6.53 | 6.29 | 6.09 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 4.96 | 4.93 | 5.19 | 4.96 | 4.86 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 5.07 | 5.08 | 5.30 | 5.09 | 4.99 | - | - |

(අ) 2021 වසරේ මැයි මස 13 වැනි දිනෙන් අවසන් වන සතිය සඳහා

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*